# යටියන්තොට ප්‍රාදේශීය සභාව
# 2024 වර්ෂය සඳහා සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම

මෙහි පහත උපලේඛනයේ දැක්වෙන සැපයුම් හා සේවාවන් සඳහා 2024 වර්ෂයට සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේ අයදුම්පත් **2023.12.29** දින **පස්වරු 3.00** දක්වා මා විසින් භාර ගනු ලැබේ. ඔබ යටියන්තොට ප්‍රාදේශීය සභාවේ සැපයුම්කරුවෙකු ලෙස ලියාපදිංචි වුවහොත් භාණ්ඩ හා සේවා සපයා ගැනීමේදී සිදු කරන මිල සැසඳුම් හැර වෙනත් මිල කැඳවීම්වලදී ඔබ ආයතනයේ ලිපිනයට මිල කැඳවීම් පත්‍රයක් සභාව විසින් යොමු කරනු ලැබේ.

1. තමන් විසින් පිළියෙළ කර ගත් අයදුම්පත් මගින් ඉල්ලීම් ඉදිරිපත් කළ යුතු අතර නියමිත දිනට පෙර පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.

2. සියලුම සැපයුම්කරුවන් තමන්ගේ අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා ජාතික හැඳුනුම්පතේ ඡායාපිටපතක්, ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් , සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතික ලියාපදිංචි වන අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතුය.

3. කොන්ත්‍රාත් හැර අනෙකුත් සැපයුම් හා සේවාවන් සඳහා ආපසු නොගෙවන රු.1000.00ක මුදලක් ගෙවිය යුතු අතර එය මුදලින්, චෙක්පත් මගින් හෝ මුදල් ඇණවුම් මගින් ගෙවිය හැකිය. මුදල් ඇණවුම් හා චෙක්පත් **"ලේකම්, ප්‍රාදේශීය සභාව,යටියන්තොට"** නමින් අයදුම්පත සමග එවිය යුතු අතර මුදල් ඇණවුම් මාරු කරන තැපැල් කාර්යාලය **යටියන්තොට** යනුවෙන් සඳහන් කළ යුතුය.

4. කොන්ත්‍රාත් සඳහා ලියාපදිංචි වීමට, ඉල්ලන වටිනාකමින් අඩකට සමාන වත්කම් සහතික ඉල්ලූ විට ඉදිරිපත් කළ යුතුය.

5. ඉල්ලුම් කරන විට මිල ගණන් ඉදිරිපත් නොකරන, ඇණවුම් කළ විට සැපයුම් නොකරන නියමිත ප්‍රමිතීන්ට අනුකූල නොවන භාණ්ඩ හා සේවා සපයන සැපයුම්කරුවන්ගේ නම් නැවත දැනුම්දීමකින් තොරව ලියාපදිංචි කළ ලේඛනයෙන් ඉවත් කර අසාධු ලේඛනයට ඇතුළත් කරනු ලැබේ.

6. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2024"** යනුවෙන් සඳහන් කර නියමිත දින නියමිත වේලාවට පෙර එවිය යුතුය.

7. වැඩි විස්තර කාර්යාල වේලාව තුළ සභා කාර්යාලයෙන් විමසා දැනගත හැකිය.
   දුරකථන අංකය - **036-2270237**
   විද්‍යුත් ලිපිනය - **yatiyantotaps@gmail.com**

# <u>උපලේඛනය</u>

**01. සැපයුම්**

- I. ලිපිද්‍රව්‍ය
- II. මුද්‍රිත ලිපිද්‍රව්‍ය
- III. කාර්යාලීය ගෘහ භාණ්ඩ (වානේ / දැව)
- IV. සෞඛ්‍ය අංශයට අයත් සනීපාරක්ෂක උපකරණ
- V. කර්මාන්ත අංශයට අයත් උපකරණ
- VI. ඉදිකිරීම් ද්‍රව්‍ය (ගල්,වැලි,සිමෙන්ති ආදිය)
- VII. වීථි පහන් නඩත්තුව ඇතුළු අනෙකුත් කටයුතු සඳහා අවශ්‍ය විදුලි උපකරණ
- VIII. මෝටර් රථ අමතර කොටස් (ඩීසල්/පෙට්‍රල්) සහ ටයර් ටියුබ් සැපයීම
- IX. ක්‍රීඩා උපකරණ
- X. රබර් සීල්,දින මුද්‍රා, බැනර්, නාමපුවරු සැකසීම හා පොස්ටර් මුද්‍රණය
- XI. පුස්තකාල පොත් සැපයීම
- XII. පරිගණක උපාංග (ටෝනර්,රිබන් ඇතුළු පරිගණක උපාංග ) සැපයීම
- XIII. කාර්යාලීය ඉලෙක්ට්‍රොනික උපකරණ (පරිගණක,ෆැක්ස්,ඡායාපිටපත් යන්ත්‍ර ආදිය)
- XIV. ගොඩනැගිලි ද්‍රව්‍ය

**02. සේවාවන් හා කොන්ත්‍රාත්**
**( CIDA / පළාත් සභා ලියාපදිංචිය සහිත ඉදිකිරීම්කරුවන් සඳහා පමණි )**

- I. නීතිඥ හා උපදෙස් සේවාවන්
- II. මෝටර් රථ හා යන්ත්‍ර අලුත්වැඩියාව හා සේවා කිරීම
- III. යතුරුලියන හා පරිගණක අලුත්වැඩියා හා සේවා කිරීම
- IV. සිංහල,දෙමළ හා ඉංග්‍රීසි භාෂා පරිවර්තන
- V. අනතුරුදායක ගස් කැපීමේ සේවාව ඉටු කිරීම
- VI. වෙල්ඩින් පැස්සුම්කරුවන්
- VII. මේසන් වැඩකරුවන්
- VIII. කාර්යාල ආරක්ෂක සේවාවන් `
- IX. ඉදිකිරීම් කොන්ත්‍රාත්

**03. කොන්ත්‍රාත් සඳහා ලියාපදිංචි කිරීමේ ගාස්තු**

| | | |
|---|---|---|
| I. | ව්‍යාපෘති වටිනාකම රු.150,000.00 දක්වා | රු.1,500.00 |
| II. | රු.150,000.00 - රු.300,000.00 | රු.3,600.00 |
| III. | රු.300,000.00 - රු.400,000.00 | රු.4,275.00 |
| IV. | රු.400,000.00 - රු.500,000.00 | රු.5,700.00 |
| V. | රු.500,000.00 - රු.2,000,000.00 | රු.6,300.00 |
| VI. | රු.2,000,000.00ට වැඩි වටිනාකම සඳහා | රු.7,500.00 |

**දුමින්ද සී.වික්‍රමසිංහ**
ලේකම්
යටියන්තොට ප්‍රාදේශීය සභාව

## <u>යටියන්තොට ප්‍රාදේශීය සභාව</u>

## <u>2024 වර්ෂය සඳහා සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම</u>

1. ව්‍යාපාරයේ නම සහ ලිපිනය - ..........................................................................................
..........................................................................................
..........................................................................................

2. අයිතිකරුගේ නම -..........................................................................................

3. ජාතික හැඳුනුම්පත් අංකය - ..........................................................................................

4. දුරකථන අංකය - ..........................................................................................

5. ෆැක්ස් අංකය - ..........................................................................................

6. විද්‍යුත් තැපැල් ලිපිනය - ..........................................................................................

7. වැට් ලියාපදංචි අංකය - ..........................................................................................

8. සැපයීමට අපේක්ෂිත අයිතමය - ..........................................................................................
..........................................................................................

9. සැපයීමට අපේක්ෂිත අයිතමයේ අංකය -..........................................................................................

10. ලියාපදිංචි ගාස්තුව - ..........................................................................................

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, කොන්දේසි වලට එකඟ බවත් ප්‍රකාශ කර සිටිමි.

..........................................                ..........................................

දිනය                අයදුම්කරුගේ අත්සන